**ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 දෙසැම්බර් 15 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කර ඇත. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 332.91 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 200.04 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 132.87 ක් හෙවත් සියයට 40 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 112.08 | 104.69 | 7.39 | 7 |
| මූලධන | 220.83 | 95.35 | 125.48 | 57 |
| මුළු එකතුව | 332.91 | 200.04 | 132.87 | 40 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.50 | 6.26 | 3.00 | 3.99 | 26.00 | 15.65 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ පොදු තැන්පත් ගිණුම් 4 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 9.08 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0001/0121/000 | 269,847 |
| 6000/0000/00/0002/0170/000 | 20,000 |
| 6000/0000/00/0015/0091/000 | (751,281) |
| 6000/0000/00/0016/0115/000 | 9,545,312 |
| **එකතුව** | 9,082,878 |

**2.4 විගණන නිරීක්ෂණය**

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව විසින්, මුදල් රෙගුලාසි 454 (1) අනුව බඩු වට්ටෝරු ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 15.7 ක් වැයකර දේශීය නියෝජිත ආයතනයකින් මිලදී ගෙන තිබුණු සිතියම් පරිලෝකන යන්ත්‍රයට අදාළ නිෂ්පාදකයාගේ බලය පැවරීමේ ලිපියේ මුල් පිටපත, වසර තුනක කාලයක් සඳහා වු වගකීම් සහතිකය සහ නිෂ්පාදිත වර්ෂය සනාථ කෙරෙන ලියවිලි යනාදී සාක්ෂි ඉදිරිපත් නොකෙරුනි.

**3.3 විසර්ජන ගිණුම**

-----------------

**අයවැය විචලනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වැය විෂයයන් 19 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 427 හි විධිවිධාන පරිදි දෙපාර්තමේන්තු ගිණුම් පොත්, භාණ්ඩාගාර පොත් හා සැසඳීමට සැසඳීම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත් පොදු තැන්පත් ගිණුම් සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) අංක 6000/0000/00/0015/0091/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර අවසාන පරිගණක මුද්‍රිත සටහන පරිදි ඍණ ශේෂය රු. 752,281 ක් වුවද විසර්ජන ගිණුමෙහි ඇතුළත් අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශ ප්‍රකාශයෙහි එම ශේෂය දක්වා නොතිබුණි.

**3.5 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------

විෂය අංක 20901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.415,833, ක් වූ අතර එම හිඟහිටි ශේෂ සඳහා වර්ෂ 3 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක් ගතවී තිබුණත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක ශේෂයන් අතර රු.65,638 ක වෙනසක් නිරීක්ෂණය විය.

**3.6 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

---

**අභ්‍යන්තර විගණනය**

---

අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණද අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

(අ) රත්නපුර උප කාර්යාලය සඳහා 2015 දෙසැම්බර් මස රු. 2,927,481 ක් වටිනා වානේ රාක්ක සහ උපාංග මිලදී ගෙන තිබූ නමුත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් යෝජිත කාර්යාල ගොඩනැගිල්ල අත්පත් කරගැනීමට නොහැකිවීම නිසා 2017 අගෝස්තු මස වන විටත් මෙම උපකරණ ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ නීතිමය තැන්පතු අංශය සඳහා 2015 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.2,459,553 ක් වටිනා රාක්ක අදාළ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් රු.14,853,858 ක මුදලක් වැය කරමින් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආපන ශාලාව ඉදිකර ඇතත් එහි වහලය නිසි ප්‍රමිතියකින් ඉදි කර නොතිබුණි. තවද සුළං කවුළු සහිත බිත්ති වෙනුවට ඉටි ආවරණ යෙදීම නිසා වැසි ජලය ආපනශාලාව තුළට ගලා ඒම හේතුවෙන් ආපනශාලාව පවත්වා තිබුණේ මාස 18 ක කාලයක් පමණි. 2016 මැයි මස වසා දමන ලද මෙම ආපනශාලාව 2017 සැප්තැම්බර් වන විටත් ආරම්භ කර නොතිබුණු බැවින් මෙම වියදම නිශ්කාර්ය බව නිරීක්ෂණය කෙරේ.

**3.8 දේශිය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

**ව්‍යාපෘති ආරම්භ නොකිරීම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පැරණි ගොඩනැගිලේ සම්පූර්ණ විදුලි පරිපථ පද්ධතිය නවීකරණය කිරීමට අදාල කොන්ත්‍රාත්තුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2016 දෙසැම්බර් 29 දින භාරදී තිබුණි. ඒ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ ඇස්තමේන්තුව රු. 13,598,750 ක් වූ අතර එම වටිනාකමින් රු. 5,608,059 ක් සඳහා වූ චෙක්පත 2016 දෙසැම්බර් 31 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි. එහෙත් 2017 සැප්තැම්බර් 21 දින වන විට මාස 8 ක් ගත වුවද එම විදුලි පරිපථ නවීකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. ගොඩනැගිල්ලේ සම්පූර්ණ අලුත්වැඩියාවක් සිදුකළ යුතුව තිබියදී විදුලි පරිපථ නවීකරණ කටයුතු සඳහා පමණක් මුදල් ගෙවීම මේ සඳහා හේතුවී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

**3.9 කාර්යසාධනය**

---

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

---

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2016 වර්ෂය තුළ විවිධ වර්ගයේ සිතියම් 5000 ක් අංකිත කර මහජනයාගේ පරිශීලනයට ලබා දීමට සැළසුම්කර තිබුණද 2017 සැප්තැම්බර් 18 දින දක්වාත් එක් සිතියමක්වත් අංකිත කර නොතිබුණි.

(ආ) රහස්‍ය ලේඛන අංශයේ පවතින ලේඛන 16,000 කට අධික ප්‍රමාණයක් තැන්පතු පෙට්ටිවල බහා තිබුණු නමුත් එම පෙට්ටි ඇසුරුම් කිරීමට සුදුසු ස්ථානයක් සකස් කර නොතිබීම හේතුවෙන් ඒවා අදාළ විෂය නිලධාරිනියගේ කාර්යාල කාමරය, පරිලෝකන (Scanning) අංශය හා ශ්‍රව්‍ය දෘශ්‍ය අංශය (Audio visual) යනාදි ස්ථානවල රඳවා තිබුණි.

(ඇ) නීතිමය තැන්පතු කෝෂ්ඨාගාරය ස්ථාපිත කර ඇති මහල් 6 කින් යුක්ත පරණ ගොඩනැගිල්ලේ දෙවන මහල ස්ථාන කිහිපයකින් වැසි ජලය කාන්දු වන බව නිරීක්ෂණය විය. වැසි ජලය නිසා තෙතමනය රඳා පැවතීමෙන් ලේඛන විනාශ වීමට ඉඩකඩ පවතින බවත්, ගොඩනැගිල්ලේ පැවැත්මට මෙන්ම ජීවිත අවදානමට මෙම වැසි ජලය හේතු විය හැකි බවත් නිරීක්ෂණය විය. මෙම තත්ත්වය වර්ෂ කීපයක සිට පැවතියද ඒ සඳහා සුදුසු පියවර ගෙන නොතිබුණි.

(ඈ) පොත් හා ප්‍රවෘත්ති පත්‍ර ලියාපදිංචි කිරීමේ අංශය වෙත ප්‍රකාශකයන් විසින් භාරදෙනු ලබන පොත් හා ප්‍රකාශන අදාළ ආයතන අතරේ බෙදාහැරීමෙන් පසු ඒවායේ විස්තර පරිගණක ගත කළ යුතුය. එහෙත් එම කාර්යය ප්‍රමාද වීම හේතුවෙන් 2016 වර්ෂයට අදාළව පමණක් පොත් හා ප්‍රකාශන 9496 ක් එසේ පරිගණක ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාර දෙනු ලබන පරණ පොත්පත්, ලිපි ලේඛන හා ලිපිගොනු යනාදිය කෝෂ්ඨාගාරවල තැන්පත් කිරීමට පෙර ධූමායනය කිරීම සාමාන්‍ය පිළිවෙත විය. එහෙත් එසේ කටයුතු නොකර කෝෂ්ඨාගාරවල අදාල ලියකියවිලි තැන්පත් කළ පසු ඒවායේ කෘමි සතුන් දක්නට ලැබුණු විට පමණක් පොත් ධූමායනය කරනු ලබන බව නිරීක්ෂණය විය. නමුත් ලැබෙන පරණ පොත් තුළ ඇසට නොපෙනෙන විවිධ කෘමි සතුන් සිටිය හැකි බැවින් තැන්පත් කිරීමට පෙර ධූමායනය කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය කෙරේ.

(ඊ) විගණනයට ලැබී තිබුණු තොරතුරු අනුව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලය මගින් 2016 වර්ෂයේදී ලියාපදිංචි අංක ලබා දුන් පොත් හා ප්‍රකාශන සංඛ්‍යාව 12,572 ක් වුවද ඉන් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ පොත් හා ප්‍රකාශන සංඛ්‍යාව 4,054 ක් විය. එය ලියාපදිංචි පොත් සංඛ්‍යාවෙන් සියයට 32 ක් පමණක් වූ අතර පොත් 8,518 ක් නීතිමය තැන්පතුවට ලැබී නොතිබුණි. මේ අනුව අදාළ මුද්‍රණාල පිළිබඳව ප්‍රමාණවත් අධීක්ෂණයන් සිදු නොවන බව නිරීක්ෂණය විය.

**3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට සකස්කළ බැංකු සැසඳුමේ ඇතුළත් මාස 6 ට වැඩි හඳුනා නොගත් හර ශේෂ වල වටිනාකම රු. 12,230 ක් වූ අතර හඳුනානොගත් ලැබීම් වල වටිනාකම රු.61,545 ක් විය .

(ආ) 2014 දෙසැම්බර් 31 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා රු.88,500ක ශේෂයක් උපලබ්ධි නොවූ චෙක්පතක් ලෙස ඇතුළත් කරමින් බැංකු සැසඳුම් තුළනය කර තිබුණි. එහෙත් එවැනි උපලබ්ධි නොවූ චෙක්පතක් දෙපාර්තමේන්තුව සතු නොවූ අතර මෙම ශේෂය පිළිබඳ පිළිගත හැකි පැහැදිලි කිරීමක් ලබා දීමටද දෙපාර්තමේන්තුව අපොහොසත් විය.

**3.11 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

-----------------------------------------

වරාය හා ගුවන් තොටුපොල බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද සැපයුම්කරු විසින් දරාගත යුතු වුවද ජංගම රාක්ක සවිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාල රු. 12,699,450 ක වරාය හා ගුවන් තොටුපොල බද්ද සහ රු. 6,733,040 ක ජාතිය ගොඩ නැගීමේ බද්ද සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

**3.12 අවිධිමත් ගනුදෙනු**

-----------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කීහිපයක් පහත දැක්වේ.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පටිපාටියෙන් බැහැරවීම**

-------------------------------------------------------------

(අ) ප්‍රසම්පාදන කාර්යයට ප්‍රමාණවත් කාලයක් නොමැති බව හේතු ලෙස දක්වමින් රු. 24,642,139 ක ලී බඩු මිලදී ගැනීමේ කටයුත්ත මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට (CECB) පවරා පසුව ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබුණද අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී නොතිබුණි. එහිදී අදාළ මිලට ගැනීම් රාජ්‍ය දැව සංස්ථාව, රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හෝ වෙනත් රාජ්‍ය ආයතන වලින් මිල ගණන් කැඳවා හෝ විවෘත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර මිල දී ගැනීමට සුදුසු බව සඳහන් අංක අමප/12/0845/555/006 දරන 2012 ජූලි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය දෙපාර්තමේන්තුවට ලැබෙන විටද අදාල උපකරණ ලබා ගැනීමේ කටයුතු ආරම්භකර තිබුණි.මේ අනුව මෙම මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශයට පටහැනිව අනුව පොත් හා ප්‍රකාශන තැන්පත් පෙට්ටි 4000 ක් සැපයීම සම්බන්ධයෙන් වූ රු.1,640,000 ක ගනුදෙනුවට අදාළ කොන්ත්‍රාත්කරු සමග විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීමකින් තොරව සිදු කර තිබුණි. මේ නිසා සැපයුම්කරු නියමිත පරිදි භාණ්ඩ නොසැපයීම මත රජයට ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට ද නොහැකිවී තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී සිතියම් අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අමතරව අවශ්‍ය වූ රු.12,572,859 ක මුදල සඳහා අතිරේක ප්‍රතිපාදනයක් ලබා ගන්නා අකාරය පිළිබඳව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (ආ) මාර්ගොපදේශය ප්‍රකාරව තහවුරුවකින් තොරව පරිලෝකන යන්ත්‍රයක් මිලදී ගැනීමේ කටයුතු ආරම්භකර තිබුණි. මෙම මිලදි ගැනීමට අදාල ප්‍රසම්පාදන කොන්දේසි 15.1 ට අනුව ඉන්වොයිසිය ලැබී දින 30 ක් ඇතුළත ගෙවීම සිදු කළ යුතුව තිබුණද 2017 අප්‍රේල් 27 දින යන්ත්‍රය හා ඉන්වොයිසිය ලැබී තිබියදීත් 2017 අගොස්තු 31 දක්වා ගෙවීම ප්‍රමාද කිරීමට සිදුවී තිබුණි.

(ඈ) සිතියම් පරිලෝකන යන්ත්‍රය නියමිත පිරිවිතර හා සැසඳෙන බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශකර තිබුණද ප්‍රධාන පිරිවිතර ලෙස ඇතුළත්ව තිබූ මුද්‍රිත අකුරු හඳුනා ගැනීමේ (OCR) පහසුකම සම්බන්ධයෙන් සැපයුම්කරු විසින් නිලධාරින්ට ලබා දී තිබූ පුහුණුවේදී අදාල පහසුකම ප්‍රදර්ශනය කර (demonstrative) පෙන්වා නොතිබුණි.

**3.13 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණයක් පහත දැක්වේ.

නව ගොඩනැගිලි පරිශ්‍රයේ මහල් හතරෙහිම පැවති විශාල ප්‍රමාණයේ විහිදුණු ඉරිතැලීම් පිළිසකර කර පැවතියද, ඉදිකර වසර 04 ක් වැනි කෙටි කාලයක් තුළ මෙලෙස ඉරිතැලීම් සිදුවීම අසාමාන්‍ය කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.තවද මෙම නව ගොඩනැගිල්ලේ දෙවන, තුන්වන හා සිවුවන මහල් සඳහා ජංගම රාක්ක පද්ධතිය (Mobile Racking System) ස්ථාපිත කළ පසු හා ඒ මත විශාල ලිපි ලේඛන ප්‍රමාණයක් තැන්පත් කිරීමත් සමග ගොඩනැගිල්ලේ මෙම ඉරිතැලීම් තවදුරටත් ව්‍යාප්ත වීමට ඉඩ කඩ ඇතැයි යන සැකය විගණයේදි බැහැර කළ නොහැකි විය.

**3.14 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතාවය නිරීක්ෂණය විය.

(අ) රු.මිලියන 169 ක ජංගම රාක්ක සවිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා වූ ගිවිසුමේ කොන්දේසි 26 (1) අනුව 2016 දෙසැම්බර් 26 දිනට පෙර වැඩ නිම කළ යුතු වුවත් 2017 මාර්තු මස දෙවැනි සතිය දක්වා එම කාලය දීර්ඝ කර තිබුණි. මේ දක්වා මෙම වැඩ නිමකර භාරදී නොතිබුණද කාර්යසාධන සුරක්ෂණයෙහි කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2017 ජුනි 22 දිනට ප්‍රමාද වූ දින 112 ක් සඳහා අයකර ගතයුතු ප්‍රමාද ගාස්තුව රු. මිලියන 16.9 ක් විය.

(ආ) ආපන ශාලාව දීර්ඝ කාලයක් තිස්සේ වසා තිබීම හේතුවෙන් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව තුළ වූ 117 දෙනෙකුගෙන් සමන්විත වූ කාර්යය මණ්ඩලයට සහ පුහුණු පාඨමාලා ආදියට සහභාගි වන්නන්ට ආහාර පාන ලබා ගැනීමට සුදුසු ස්ථානයක් නොපැවති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) 2015 වර්ෂයේදි රු.6,000,000 කට මිළදී ගැනීමට ඇස්තමේන්තු කර තිබූ සිතියම් පරිලෝකන යන්ත්‍රය මිලදී නොගෙන 2017 වර්ෂයේදී රු. 15,752, 859 කට මිළදී ගෙන තිබුණි. මේ හේතුවෙන් එම යන්ත්‍රය සඳහා මුල් ඇස්තමේන්තු මිළ මෙන් සියයට 162 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.15 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 30 | 05 | 25 |
| (ii) | තෘතියික මට්ටම | 12 | 10 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 164 | 51 | 113 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 85 | 51 | 34 |
| | එකතුව | 291 | 117 | 174 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකරණයට අනුව "ලේඛන ප්‍රතිසංස්කාරක" යන තනතුරු නාමය, "අධිලේඛන සංරක්ෂණ නිලධාරි" ලෙස සංශෝධනය කර කර ඒ සඳහා තනතුරු 28 ක් අනුමත කර ඇති බවද, එම තනතුර "අධිලේඛන සංරක්ෂක" වශයෙන් නැවත වෙනස් කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇතිබවද වාර්තාකර තිබුණි. නමුත් මේ දක්වා එම කාර්යය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීමෙන් දෙපාර්තමේන්තුව තුළ වර්ෂ ගණනාවකට පෙර ආබද්ධ කර ගත් ලේඛන විශාල සංඛ්‍යාවක් සංරක්ෂණය කිරීමකින් තොරව කෝෂ්ඨාගාරවල තැන්පත් කර තිබුණි.

(ආ) සූක්ෂම ඡායාරූප අංශයේ දැනට එක් නිලධාරියෙක් සහ සහායකයෙක් පමණක් සේවයේ නියුක්තව සිටි අතර එම අංශයේ කාර්යමණ්ඩල ඌනතාවය හේතුවෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ප්‍රවෘත්ති පත්‍ර සියල්ලම ඡායාගත කිරීමට නොහැකිව පවතින බව නිරීක්ෂණය විය. මෙම අංශයේ සේවයේ නියුක්තව සිටි නිලධාරින් දෙදෙනකු 2008 වර්ෂයේ දී හා 2017 ජුනි මස වන විට විශ්‍රාම ගොස් තිබුණද එම පුරප්පාඩු පිරවීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. තවද මෙම අංශය විසින් මහජන ඉල්ලීම්වලට ප්‍රමුඛස්ථානය දෙමින් පිටපත් ලබා දීමේ කාර්යයද සිදුකළ යුතුව තිබුණි.

(ඇ) ප්‍රවෘත්ති පත්‍රවල මෘදු (soft) පිටපත අදාළ පුවත්පත් ආයතනවලින් ලබාගෙන සංරක්ෂණය කිරීම මඟින් ප්‍රවෘත්ති පත්‍ර සංරක්ෂණය කිරීමේ කාර්යය නවීන තාක්ෂණය මඟින් කාර්යක්ෂමව ඉටු කිරීමට වැඩ පිළිවෙලක් සකසා නොතිබුණි.

(ඈ) සිතියම් අංකිත කිරීමේ ව්‍යාපෘති සැලැස්මට අනුව ( Map Digitalization) යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා සේවකයන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික තනතුරු (ප්‍රතිව්‍යුහගත කරණය යටතේ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක නිලධාරි ) 08 ක් අනුමත වී තිබුණද දැනට සිටින්නේ එක් නිලධාරියෙක් පමණි. මෙම නිලධාරියා විශ්‍රාම යාමට ආසන්නව සිටියද පුරප්පාඩු පිරවීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.